**25 වන පිටෙන්**

ඉතින් මට පොලොවේ පස් කන්න හිතුනා, මෙච්චර පැය භාගෙටත් වඩා වෙහෙසිලා... අම්මේ ඔයාට කරන්න තියෙන්නේ වැඩ දෙකයි. දැන් බබාට මූත්‍රා අඩු නිසා අපි සියළු දියර ජාති සේලයින් එකෙන් දෙනවා. එනිසා බොන්න දෙන්න එපා ( මූත්‍රා හරියට පැයෙන් පැය මැනිලා කියන්නල මම ඇඟිලි දෙකක් ඔසවලා ඇයට පෙන්නමින් කීවා. ඒත් මෙයා පැය තුනක් යද්දි ඔන්න මැනලාම නෑ.

"හා දැන් දාන්න මේ පැයේ බලමුල මම කීවා.
ඔන්න අම්මා ටිකකින් එනවා.  ලකොච්චරක් තිබ්බද?"
"සිරින්ජර 3යි පොඩ්ඩයි"
"කෝ ගේන්න සිරින්ජරේ, ඉතින් ඔය පොඩ්ඩ මනින්නනේ සිරින්ජරේ දුන්නේ"



අම්මා මට සිරින්ජරේ දික් කරමින්, දෙකේ ස්ළකුණ පෙන්වයි. ඇයට කියවා ගන්න බැරි බව දැන් මට වැටහේ. අහෝ මම විඳි දුකක් (

"ඩොක්ටර් ඔයාගේ කට ගලක උලාගත්තනම් හොඳයි කියලා හිතුනා නේද?" වාට්ටුවේ මිස්කෙනෙක් අසයි.

අප වෙත එන බොහෝ මව්වරුන් මෙවැනි අඩු ආදායම් ලාභී පවුල් වල හරි හමන් ඉගෙනුමක් ලැබූ අය නොවේ. ඔවුන් කියන දේවල් ඒ අයුරින්ම ගත්තා නම් මේ දරුවන්ට එක්කෝ අපි වැඩිපුර දියර දී අමාරු කරගෙනය, නැත්නම් අඩුවෙන් දියර දී විජ්ලනය කරගෙනය.

මේ ලංකා අහස යට ආණ්ඩුවේ ඉස්පිරිතාලෙක වැඩකරනවා යනු විටෙක අප, නඩුකාර උන්නාන්සෙලාය, විටෙක ගණිත ගුරුවරුන් ය. විටෙක පෝෂණවේදීන් ය. විටෙක පවුල් ආරවුල් විසඳන අයවලුන් ය. ඇඳුම් සපයන්නෝය, සෙල්ලම් බඩු සපයන්නෝ ය. මදුරු දැල් ගෙන එන්න ආධාර සොයන්නවුන් ය. මිතුරන් සමග එකතුවී වාට්ටු පේන්ට් කරන පේන්ට් බාස්සුනැහැලාය.

කොටින්ම වාට්ටුවේ හෝ රෝහලේ කුදු මහත් අඩු පාඩුකම් පෙනෙද්දී දෑස් පියන් අපේ වැඩේ විතරක් කරගෙන පාඩුවේ ඉන්නට බැරි බැරියාව ඇති අය ය. එහෙම අයට මේවායේ කරන්නට වැඩ ඕනෑ තරම් ය.

මේ සියලු සංවේදනා විටෙක වෙහෙසක් ය. මතක් කරද්දී සැනසෙන්නට කරුණු ඕනෑ තරම් ය (






සිසිර දිසානායක

ආනන්දයේ ආනන්දය නැංවූ අනිල් මිහිරිපැන්න ඇදුරානෝ

අපගේ සංගීත ක්ෂේත්‍රයේ ආධ්‍යාපනික සුදුසුකම් ලබමින් ඉදිරියට යන ශිල්පීහු බොහෝ වෙති.  "විශාරද", "නිපුන් ", "පණ්ඩිත් ", වැනි සුදුසුකම් ලැබීමට ඒ ශිල්පීන් ඉන්දීය රාගධාරී සංගීතය ඇසුරෙන් පැවැත්වෙන විභාග සඳහා පෙනී සිටිය යුතු වෙයි. ඒවා හුදෙක් ප්‍රශ්ණ පත්‍රයකට සීමා නොවී ගායන හෝ වාදන ප්‍රායෝගික පරීක්ෂණයන්ගෙන් ද සමන්විතයි.

මුල් යුගයේ මේ විභාග සහ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අපගේ ශිල්පීන්ට භාරතයට යාමට සිදුවිය. එම විභාග සඳහා ඉගැන්වීම් කරනු ලැබුවේ ද භාරතයේ පමණකි. කෙසේ වුවද මේ වන විට මව් බිමේ මෙම විභාග ඉලක්ක කොටගෙන ගායනය හා වාදනය ඉගැන්වීමත්, ඉන්දීය සංගීතවේදීන් ගෙන්වා විභාග හා පරීක්ෂණ පැවැත්වීමත් කෙරෙනා ආයතන බිහි වී ඇත්තේය. එකී විභාගවලට මූලික සුදුසුකම් ලෙස



සැලකෙන "ප්‍රාරම්භ", "මධ්‍යම" සහ " අවසාන" විභාගය සඳහාද මේ ආයතනවල ඉගැන්වීම් කෙරෙනා අතර, විභාග හා පරීක්ෂණ ද පැවැත්වෙයි. මෙලෙස පවත්වාගෙන යන මේ සංගීත අධ්‍යාපන ආයතන අතර අගනුවර ඇති " සාරදා" සංගීත නිකේතනය පුරෝගාමී ආයතනය වෙයි. මේ ආයතනය 1983 දී ආරම්භ කළ ප්‍රවීණ බටනලා සහ එස් රාජ් වාදන විශාරද අනිල් මිහිරිපැන්න සංගීතවේදීයාණන් පසු ගිය මාසයේ සිය දිවියෙව් සමු ගත්තේය.

කුඩා කල පටන් ම බටනලාවට මහත් සේ ඇළුම් කළ අනිල මිහිරිපැන්න සිසුවා අත නිතරම බටනළාවක් විය. පිළියන්දල සංගීතය උගැන්ම ඇරඹුව ද ඉන් නො සෑහී භාරතයේ ශාන්ති නිකේතනයෙන් සංගීතය හදාරා පැමිණි එඩ්වින් සමරදිවාකර ශූරින්ගෙන් ද සංගීතය හද- ාරන්නට මේ සිසුවා උනන්දු විය. එය ඔහුව භාරතයේ ශාන්ති නිකේතනය නැතහොත් විශ්ව භාරතීය විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට යොමු කරවීමක් විය. භාරතයේ සිටි සිව් වසර්දී අසිස්චන්ද්‍ර බෙනර්ජි ශූරින්ගේ එස්රාජ් වාදනයන්, ගෝර්ගෝ ස්යාම් සංගීතවේදියාණන්ගෙන් බටනලාවත් හැදෑරීමට ලැබීම අනිල් මිහිරිපැන්න තරුණයාගේ දෛවයේ යම් පෙරළියකි. වසර 1955 දී විශ්ව විද්‍යාලයට ඇතුළත්ව 1969 පෙරළා මව් බිමට පැමිණ සංගීතාචාර්යවරයෙකු ලෙස පාදුක්ක මහා විද්‍යාලයේ සේවය ඇරඹූ අනිල් මිහිරිපැන්නයන් අනතුරුව විද්‍යාල කීහිපයකම සේවය කළේය.

වසර 1977 දී ඇමරිකාවට ගොස් එහිදී මාස හයක් තුළ වෙස්ලියන්, ග්‍රේටන් සහ ඕව හා විශ්ව විද්‍යාලවල වැඩමුළු සහ ප්‍රසංග පැවැත් වූ අනිල් මිහිරිපැන්නයන්ට සිය සො- යුරු බැසිල් මිහිරිපැන්න ප්‍රවීණ වේදිකා රංගනවේදියාණන් සහ ප්‍රවීණ තබ්ලා වාද්‍ය ශිල්පී ඩී.ආර්. පීරිස් කලාකරුවාණන්ද එක් වූහ. මේ කළාකරුවන් තිදෙනාම එරට සම්මාන පුරවැසිභාවය පිරිනමන්නට නෙබ- ූස්කා අග්‍රාන්ඩුකාරවරයා කටයුතු කිරීම සා- ඩම්බරයට කරුණකි. "ඩිස්ටිංගිෂ් ලීඩර්ෂිප් " ඃසිඑසබටමසිය ඛ්ැරියසච* නැමැති අධි සම්මානය පුදමින් "බයෝග්‍රැෆිකල් ඉන්- ස්ටිටියුට්"  අනිල් මිහිරිපැන්න සංගීතවේදියාණන්ව ඇගයීමට ලක් කිරීමද විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

වසර 2002 දී අනිල් මිහිරිපැන්නයන් විසින් රචිත "කොම්පොසිෂන් ඔෆ් නෝර්ත් ඉන්ඩියන් ක්ලැසිකල් මියුසික් " නම් වූ අත්පිටපතට "සංගීතවේදය" ඃඑම්සජදකදටසිඑ* උපාධිය පිරුනැමුණු අතර එය ද එතුමන්ගේ මියැසි දිවිය අගැයුණ තවත් අවස්ථාවකි.

ගුවන් විදුලියේත්, රූපවාහිනියේත් ශාස්ත්‍රීය සංගීත වැඩසටහන් ඉදිරිපත් කළ අනිල් මිහිරිපැන්නයන්  "නින්ජා ශ්‍රී ලංකා" චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කරමින් සිනමාවට ද සම්බන්ධ විය. ගීතයේ පසුබිම වන සංගීත ක්ෂේත්‍රය වෙනුවෙන් නිහඬව අනුපමේය සේවයක් කළ අනිල් මිහිරිපැන්නයන් මෙවර "ගී සඳළුවෙන් " සිහිපත් කරන්නේ එදා මෙදා තුර නොමියෙන ගීතයක් කොළඹ ආනන්ද විද්‍යාලය වෙනුවෙන් නිර්මාණය කර දුන් බව ද සිහිපත් කරවමින්. වසර 1969 දී විද්‍යාලයේ සංගීතාචාර්වරයා ලෙසින් පත්ව යුධ හමුදා ශිෂ්‍ය භට බලකායේ ආනන්ද විද්‍යාලයීය හේවිසි තූර්‍යවාදක බණ්ඩයේ පිහිටුවීමට පුරෝගාමී වූ අනිල් මිහිරිපැන්නයන්, ඊට උපදෙස් දුන් කර්නල් පී.ඩබ්ලිව්. රා- ජපක්ෂ විදුහල්පතිතුමාගේ අදහස් අනුව නිර්මාණය කළ ගීයකි. "අනන්දේ හඬ අනන්දයි" ගීතය එවකට සිසුවකු වූ ප්‍රනීත් අබේසුන්දරයන්ගේ පියාණන් වූවිමල් අභයසුන්දර මහත්මාගේ පද රචනාවකට අනුව ස්වතන්ත්‍ර ගීයක් ලෙස නිර්මාණය වූ මේ ගීතය එදා මෙදා තුර දිනපතාම පාසැල අවසන් වන විට විද්‍යාලය පුරා ඇති ශබ්දවාහිනී යන්ත්‍ර ඔස්සේ ප්‍රචාරය වෙයි.

වසර දශක පහකය ආසන්න කාලයක් තිස්සේ ආනන්දයීයන්ගේ හදවත් තුළට ආනන්දයේ අනන්දය කැවූ මේ ගීය පාසැල් ගීය තරමටම අනන්දයීයන් සහ ආදි ආනන්දයීයන් අතර ජනප්‍රිය වූ ගීයකි. ඒ ආනන්දය මුසු කරමින් සංගීත ක්ෂේස්ත්‍රය නැංවූ අනිල් මිහිරිපැන්න ඇදුරුතුමන්ට නිවන් සුව පතන්නෙමු.

**ආනන්දයි - ආනන්දයි**
**ආනන්දේ හඬ ආනන්දයි**

**සම්මා සම්බුදු සුගත තතාගත**
**සම්බුදු පිළිමය අබියසදී**
**කෙළෙසුන් දුරු වී අත් යුග හිස දී**
**ආනන්දයි.....**

**සිල්ගත් තනි සුදු නෙළුම් කුසුම ලෙස**
**පැහැදි පිබිදී පිරිසිදු වී**
**මුණිදුන් නමදිමු අත් යුග හිස දී**
**ආනන්දයි.....**

රචනය : විමල් අබේසුන්දර
සංගීතය : අනිල් මිහිරිපැන්න
ගායනය : ආනන්ද විද්‍යාලයීය සිසුන්